සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2023 ජූලි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

2023-08-27
පස්වරු
[02.00 – 05.00]

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, කේවලස්වාමි ව්‍යාපාරයක් සමඟ සැසඳීමේදී හවුල් ව්‍යාපාරයක ඇති වාසියක් තෝරන්න:

(1) අසීමිත වගකීම. (2) නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.

(3) අවධානම බෙදාහැරීම. (4) ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, ප්‍රවාහන පද්ධතියක මූලිකාංගයක් **නොවන්නේ** කුමක් ද?

(1) සැකසීම. (2) පර්යන්තය. (3) බලය. (4) මාධ්‍යය.

**1.3** පහත සඳහන් සාධක අතුරෙන්, ගෝලීයකරණය (globalization) සඳහා අවස්ථාවක් **නොවන්නේ** කුමක් ද?

(1) නිදහස් වෙළඳාම. (2) ලාභදායී ශ්‍රමය.

(3) මෙහෙයුම් ප්‍රසාරණය කිරීම. (4) සංස්කෘතික වෙනස්කම්.

1.4 කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් සකස් කර ඇති පහත සඳහන් ප්‍රධාන ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සළකා බලන්න:

**(a)** පරිසරය සක්‍රීය කිරීම.

**(b)** නවීන සුදුසු තාක්ෂණය.

**(c)** මූල්‍ය සඳහා ප්‍රවේශය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල (SMEs) කාර්යසාධනය ඉහළ නැංවිය හැකි ප්‍රතිපත්තිය / ප්‍රතිපත්ති වන්නේ:

(1) **(a)** පමණි.
(2) **(a)** සහ **(c)** පමණි.
(3) **(b)** සහ **(c)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.

1.5 පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

**(a)** චෙක්පත් මගින් ගෙවීම් කළ හැකි වීම.

**(b)** ගිණුම් ශේෂය මත පොලී ලැබීම.

**(c)** ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීමේ හැකියාව.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, ජංගම ගිණුම් හිමියෙකුට, ජංගම ගිණුමකින් ලැබෙන වාසිය / වාසි වන්නේ:

(1) **(a)** පමණි.
(2) **(a)** සහ **(b)** පමණි.
(3) **(a)** සහ **(c)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.

1.6 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන්, මූල්‍ය වෙළෙඳපොළ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) ප්‍රාග්ධන වෙළෙඳපොළ, ප්‍රාථමික වෙළෙඳපොළ සහ ද්විතියික වෙළෙඳපොළ වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.
(2) මුදල් වෙළෙඳපොළ යනු දිගුකාලීන අරමුදල් සඳහාම වන වෙළෙඳපොළකි.
(3) භාණ්ඩාගාර බිල්පත් සහ වාණිජ පත්‍රිකා, ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ප්‍රධාන උපකරණ වේ.
(4) හිමිකම් කොටස් (Equity shares), මුදල් වෙළෙඳපොළෙහි භාවිත වන උපකරණයක් සඳහා උදාහරණයක් වේ.

1.7 වර්තමානයේ එකඟ වූ මිලකට අනාගතයේදී සමාගමක කොටස් මිලදී ගැනීම සඳහා වන හිමිකම ලබාදෙමින් නිකුත් කරනු ලබන ලියවිල්ල වන්නේ:

(1) කොටස් බලපත්‍රයයි.
(2) සංස්ථා ප්‍රකාශයයි.
(3) කොටස් සහතිකයයි.
(4) සාංගමික ව්‍යවස්ථාවලියයි.

1.8 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ සංයුතියට ඇතුලත් **නොවන්නේ** කුමක් ද?

(1) මූල්‍ය ආයතන.
(2) ශ්‍රී ලංකා මහ බැංකුව.
(3) වෙළෙඳ අමාත්‍යාංශය.
(4) මූල්‍ය වෙළෙඳපොළ.

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, බද්ධ ව්‍යාපාරයක (Joint Venture) ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම. (2) ලියාපදිංචිය අවශ්‍ය වීම.

(3) පාර්ශව දෙකක් හෝ වැඩි ගණනක් සහභාගී වීම. (4) කෙටිකාලීන අරමුණක් සඳහා ක්‍රියාත්මක වීම.

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යවසායකත්වයේ වැදගත්කම ඉස්මතුවීමට හේතුවක් වන්නේ කුමක් ද?

(1) නිදහස් තීරණ ගැනීමේ හැකියාව.

(2) ආර්ථික සහ තිරසාර සංවර්ධනයක් උදාකරගැනීමේ අවශ්‍යතාව.

(3) ව්‍යාපාරයේ ගැටළු මගහරවා ගැනීම.

(4) ඉහත සඳහන් සියල්ලම.

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** රක්ෂණයේ ඇති හානිපූර්ණ මූලධර්මය මගින් රක්ෂණයෙන් ලාභ ලැබීමේ අවස්ථා නිර්මාණය කරයි.

**1.12** පිටසන් කිරීම යනු චෙක්පතෙහි සඳහන් ආකාරයටම ආදායකයා සිය නම ගලායන පරිදි චෙක්පත පිටුපස ලිවීමයි.

**1.13** බදුකරණයට අදාලව රජයේ ප්‍රතිපත්තිවල වෙනස්කම්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ (SMEs) අසමත් වීමට හේතුවන අභ්‍යන්තර සාධකයකි.

**1.14** සමාජ ආකල්පවල වෙනස්වීම්, කාන්තා ව්‍යවසායකත්වයේ දායකත්වය ඉහළ යාමට සාධකයකි.

**1.15** ශ්‍රී ලංකා ආර්ථිකයේ එකම කොටස් වෙළෙඳපොළ ලෙස කොළඹ කොටස් වෙළෙඳපොළ [Colombo Stock Exchange (CSE)] ක්‍රියාත්මක වේ.

*අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** "විධිමත් සංවිධානයක්" සහ "අවිධිමත් සංවිධානයක්" අතර වෙනස සඳහන් කරන්න.

**1.17** "ද්විත්ව රක්ෂණය" යනුවෙන් අදහස් වන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.18** ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයේ විචල්‍යයන් දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.19** ව්‍යවසායකයෙකුගේ කාර්යභාරයන් දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.20** "තිරසාර සංවර්ධනය" යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි නිර්වචනය කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

**සෝමසිරි** කොළඹ-හොරණ ප්‍රධාන මාර්ගය අසල එළවළු වෙළඳාමේ නිරතව සිටී. ඔහු, ඔහුගේ කුඩා ලොරි රථය, වෙළෙඳ සැල ලෙස භාවිත කරනු ලබන අතර, මිල පුවරු ලොරි රථය වටා ප්‍රදර්ශනය කරනු ලබයි. ඔහුගේ පාරිභෝගිකයන්ගෙන් බහුතරයක් කාර්යාලයන් හි සිට නිවෙස් බලා ගමන් ගන්නා මගීන් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **"සෝමසිරිගේ එළවළු වෙළඳාම"** ඔබට ව්‍යාපාරයක් ලෙස වර්ගීකරණය කළ හැකිද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) කේවලස්වාමි ව්‍යාපාරයක ලක්ෂණ තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(c) කේවලස්වාමි ව්‍යාපාරයක ඇති වාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

ලාංකීය තේ සන්නාමයක් වන **එඩ්මන් ටී** දශක ගණනාවක් තිස්සේ රුසියාවේ ජනප්‍රිය සන්නාමයකි. **එඩ්මන් ටී** හි නිර්මාතෘ **එඩී හේවගේ මහතා,** රුසියාව තුළ ඔවුන්ගේ නිෂ්පාදිත අලෙවිකරණයෙහි සහ සන්නාමකරණයෙහි පෞද්ගලිකවම නිරත වේ. රුසියාව විසින් යුක්රේනය ආක්‍රමණය කිරීම හේතුකොටගෙන බොහෝ භාණ්ඩ සඳහා රුසියාව විසින් වෙළෙඳ සම්භාධක පනවා ඇත. එබැවින් මෙම ගෝලීය දේශපාලන අස්ථාවරත්වය ඔහුගේ තේ ව්‍යාපාරයට සෘණාත්මක ලෙස බලපානු ඇති බවට ඔහු අදහස් කරනු ලබන අතර, ඔහුගේ ව්‍යාපාරය විද්‍යුත් වෙළඳාම් (E-Trade) ලෙස සිදුකිරීමට සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "වෙළෙඳ සම්භාධක / වෙළෙඳ තහනම්" යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි යන්න **නිර්වචනය කරන්න.** (ලකුණු 02)

(b) විද්‍යුත් වෙළඳාමෙන් **එඩ්මන් ටී** ආයතනයට වන අවාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) රජය ව්‍යාපාර තුළින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන ආර්ථික අරමුණු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**එක්ස්ප්‍රස් ලොජිස්ටික්** ආයතනය ජාත්‍යන්තර ව්‍යාපාරවල නියුතු ශ්‍රී ලාංකීය සමාගම්වලට ප්‍රවාහන හා සැපයුම් සේවා (logistic) සැපයීමේ නිරතව සිටී. පවතින ආර්ථික අර්බුධය නිසා හටගත් ඉහළ පිරිවැය හේතුකොටගෙන ඔවුන්ගේ ලාභ ආන්තිකය දැඩි ලෙස පහත වැටී ඇත. එබැවින් අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සමාගමේ කළමනාකාරිත්වය සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයක නිෂ්පාදිත වර්ගය අනුව භාවිත කරනු ලබන ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති වර්ග දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) ජාත්‍යන්තර වෙළඳාමට යොමුවීමෙන් ලැබෙන වාසි තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**සංජීව, සීමාසහිත ක්ලීන් වොෂ් (පෞද්ගලික) සමාගමේ** අලෙවිකරණ ප්‍රධානියා වේ. **සීමාසහිත ක්ලීන් වොෂ් (පෞද්ගලික) සමාගමේ** සෑම පළාතකම සිටින විකුණුම් නියෝජිතයන් හට වැදගත් සහ හදිසි පණිවුඩ හුවමාරුව සඳහා වට්ස්ඇප් සමූහයක් (WhatsApp groups) නිර්මාණය කිරීමට **සංජීව** අදහස් කරයි. කෙසේවුවද, සමහර විකුණුම් නියෝජිතයන් මෙම වට්ස්ඇප් සංවාද සමූහයන් නිතර පරිශීලනය කරනු නොලැබේ. මෙම සංවාද සමූහයට අමතරව, **සංජීව** ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා නිර්මාණය කොට ඇති වට්ස්ඇප් සංවාද සමූහයේද සාමාජිකයෙකු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත ක්ලීන් වොෂ් (පෞද්ගලික) සමාගම** විසින් භාවිත කරනු ලබන ඉහත සඳහන් සන්නිවේදන ක්‍රමයේ ගුණාංග (qualities) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) ඉහත සඳහන් සන්නිවේදනයන් අඛණ්ඩව පවත්වා ගැනීම මගින් සමාගමට වන වැදගත්කම් දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) "සන්නිවේදනය" හැරුණු විට, **සීමාසහිත ක්ලීන් වොෂ් (පෞද්ගලික) සමාගමේ** ව්‍යාපාර කටයුතු සුමටව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන උපකාරක සේවා තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**ශාන්ත,** වාද්දුව ප්‍රදේශයේ පදිංචි කේවලස්වාමි ව්‍යාපාරිකයෙකි. ඔහු සතුව ගෘහස්ථ පිරිසිදු කිරීමේ උපකරණ විකිණීමේ ව්‍යාපාරයක් පවතී. ඔහු මෙම උපකරණ, කුඩා හා මධ්‍ය පරිමාණ ගෘහස්ථ නිෂ්පාදකයන්ගෙන් ලබාගන්නා අතර, අම්පාර සහ මොණරාගල ප්‍රදේශවලට අලෙවි කරනු ලබයි. ඔහුගේ නිෂ්පාදිත මෙම ප්‍රදේශවල ඉතා ජනප්‍රියව පවතී. කුඩා ලොරි රථ තුනක් සහ ගබඩාවක් බවට පත්කළ නිවසක් ඔහු සතුව පවතී.

ඔහු අලෙවිකරනු ලබන නිෂ්පාදිතයන් හි මිල සාපේක්ෂව අඩු අතර, මෙම නිෂ්පාදිතයන් දෙවන ශ්‍රේණියේ ගුණත්වයෙන් යුක්ත වේ. මෙම නිෂ්පාදිතවල ගුණාත්මකභාවය සහ මිල, අදාල වෙළෙඳපොළ ඛණ්ඩයේ පාරිභෝගික අවශ්‍යතා සමග ගැලපෙන බව ඔහුගේ අදහස වේ. කෙසේවුවද, ඔහුගේ මතයට අනුව මෙම දෙවන ශ්‍රේණියේ ගුණත්වයෙන් යුතු නිෂ්පාදිත අනෙකුත් ප්‍රදේශවල, විශේෂයෙන් බස්නාහිර පළාතේ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සමඟ නොගැළපේ.

රට තුළ ඉන්ධන පිරිවැයෙහි ඉහළ යාම දරාගැනීම ඉතා අසීරු බව මෑතකදී ඔහුට අවබෝධ විය. තවද, ඉන්ධන පිරිවැය සහ ආනයනික ද්‍රව්‍ය පිරිවැය ඉහළ යාම හේතුකොටගෙන, සැපයුම්කරුවන් විසින් භාණ්ඩවල මිල ඉහළ දමන ලදි. මෙම තත්ත්වය හේතුවෙන් පිරිසිදු කිරීමේ උපකරණවල විකුණුම් මිල ඉහළ දැමීමට ඔහුට සිදුවිය. මුලදී බොහෝ පාරිභෝගිකයන් පිරිසක් මෙම මිල ඉහළ දැමීම පිළිබඳව කණස්සල්ලට පත්විය. රජය විසින් පනවනු ලැබූ ආනයන සීමාකිරීම හේතුකොටගෙන නිෂ්පාදකයින්ට සමහර උපකරණ නිෂ්පාදනයට අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීමේදී දුෂ්කරතාවයන්ට මුහුණදෙමින් සිටී.

එමනිසා, **ශාන්ත** තම අභ්‍යන්තර සහ බාහිර ව්‍යාපාරික පරිසරය සුදුසු විශ්ලේෂණයන් භාවිතයෙන් අවබෝධ කර ගැනීමට අපේක්ෂා කරයි. මේ අතරතුර, **ශාන්ත** තම මිතුරෙකු හා එක්ව තම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් වශයෙන් අනුරාධපුර ප්‍රදේශයට ව්‍යාප්ත කිරීමට උත්සාහ ගනිමින් සිටී. ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා බැංකු ණය පහසුකමක් බැංකුව විසින් අනුමත කොට ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ශදුඅත (SWOT) විශ්ලේෂණය භාවිතයෙන් **ශාන්තගේ** ව්‍යාපාරික පරිසරය **තක්සේරු කරන්න**. (ලකුණු 06)

(b) **ශාන්ත** යනු ව්‍යවසායකයෙකු ද, නැතහොත් ව්‍යාපාරිකයෙක් ද යන්න **තක්සේරු කරන්න**. (ලකුණු 04)

(c) හවුල් ව්‍යාපාරය පිහිටුවීමේදී **ශාන්ත** ට සම්බන්ධ කරගත හැකි හවුල්කරුවන් වර්ග තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(d) **ශාන්ත** ට රක්ෂණය කළ නොහැකි අවදානම් දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(e) රජය විසින් ව්‍යාපාර සංවිධානයන්ට ලබාදෙන පහසුකම් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |